**එම් බී එස් එල් රක්ෂණ සමාගම - 2016**

**----------------------------------------------------**

සීමාසහිත **එම් බී එස් එල් රක්ෂණ සමාගමේ** ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරනු ලබන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබාගන්නා ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තා කිරීම**

2007 අංක 07 දරන සමාගමේ පනතේ 163(2) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පහත කරුණු සඳහන් කරමි.

(අ) මතය පිළිබඳ පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණන සඳහා අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියට අනුකූල වන බවත්ය.

කෙසේ වුවද, සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අර්ධයකටත් වඩා අඩු බවත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය ප්‍රකාර ප්‍රාග්ධන තත්ත්වය පිළිබඳ බරපතල පාඩුවකට මුහුණ දෙන බවත් අවධානයට ලක් කළ යුතුය.

- මූල්‍ය ප්‍රකාශනවල 33 සටහනේ සාකච්ඡා කර ඇති පරිදි, 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වගන්තියට අනුකූලව සමාගම දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ලෙස වෙනම සමාගම් දෙකකට වෙන්කර නොමැත.

- මාගේ පරීක්ෂණයෙන් පෙනී යන පරිදි, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 47 (2) වගන්තිය ප්‍රකාර සමාගම විසින් එහි ගිණුම් වාර්තා සමාගමේ මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පැහැදිලිව නිරූපනය වන අයුරින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නියම කර ඇති රීතිවලට අනුකූලව පවත්වා ඇත.

  කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල 33 සටහනින් අනාවරණය වන පරිදි සමාගමේ ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සඳහා හා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ රෙගුලාසිය මගින් ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය "නුබුන්වත් ආන්තිකය (අවදානම පදනම් වූ ප්‍රාග්ධනය)" 2015 රීතිය සඳහා අවම අවශ්‍ය ප්‍රවේශ ලක්ෂ්‍යය සම්පූර්ණ නොකරන අතර ජීවිත රක්ෂණ ව්‍යාපාරය විසින් ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය සඳහා අවශ්‍ය අවම ප්‍රවේශ ලක්ෂ්‍යය සම්පූර්ණ නොකරයි.

**2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත ප්‍රකාරව, සමාගමේ ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර හා ජීවිත රක්ෂණ ව්‍යාපාර විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය සඳහා අවම අවශ්‍ය ප්‍රවේශ ලක්ෂය සම්පූර්ණ කර නොතිබුණි. මේ හේතුවෙන්, සමාගමේ බලපත්‍රය අත්හිටුවා ඇති අතර 2016 ඔක්තෝබර් මාසයේ 04 වැනි දින සිට නව රක්ෂණ ඔප්පු නිකුත් කිරීමට සමාගමට නොහැකි වී ඇත.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු.220,524,000 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදුවලට පෙර රු.100,568,000 ක ශුද්ධ අලාභයක් විය. එමගින් තවදුරටත් සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.119,956,000 ක පිරිහීමක් නිරූපනය විය. පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලාභ සහ වන්දි ගෙවීම් ඉහළ යාම සහ 2016 ඔක්තෝබර් 04 වැනි දින සිට සමාගම් බලපත්‍රය අත්හිටුවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පූර්ව වර්ෂය හා සැසඳීමේදී ජීවිත රක්ෂණ සඳහා වාරික ගෙවීම 3,616 කින් හෙවත් සියයට 82 කින් ඉතා සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටී ඇති අතර විකුණුම් සහ අලෙවිකරණ කාර්යමණ්ඩලයේ අකාර්යක්ෂමතාවය ඒ සඳහා හේතු වී ඇත.

(ආ) 2013, 2014 සහ 2015 යන වර්ෂවල දළ වාරික වටිනාකම පිළිවෙලින් රු.1,414,107,678, රු.1,261,486,287 හා රු.1,436,431,766 ක් වුවත් 2016 වසර සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.2,600,000,000 ක් විය. ඒ අනුව එය 2016 වර්ෂයේ තත්‍ය වටිනාකම රු.1,355,241,000 කින් ඉක්මවා තිබුණි. එහෙයින් 2016 වර්ෂය සඳහා ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවලින් දළ ලිඛිත වාරික පුරෝකථනය කිරීමේදී තාත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳ අවධානය යොමු කර නැත.

(ඇ) 2016 වර්ෂය තුළ රු.මිලියන 50 ක බදු පසු ලාභයක් ඉපැයීම සමාගම සැලසුම් කර තිබුණද, රු.මිලියන 231 ක බදු පසු අලාභයක් අත්වී තිබුණි. මෙයට අනුරූපී පූර්ව වර්ෂයේ රු.මිලියන 109 ක අලාභය හා සංසන්දනය කිරීමේදී බදු පසු අලාභය රු.මිලියන 122 කින් හෙවත් සියයට 112කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 4.1 කාර්යසාධනය

**-----------------------**

#### 4.1.1 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

**---------------------------------------**

සීමාසහිත එම්.බී.එස්.එල්. රක්ෂණ සමාගම විසින් නිකුත් කර ඇති වාර්ෂික වාර්තාව අනුව සමාගම විසින් ඉටුකර ගැනීමට නියමිත ප්‍රධාන අරමුණු 07 ක් සඳහන් කර තිබුණි. කෙසේ වෙතත් එම අරමුණු සාක්ෂාත් කරගැනීම පිළිබඳ ඇගයීම සඳහා තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 වත්කම් කළමනාකරණය

--------------------------------

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව පරිගණක සහ උපාංග, කාර්යාලීය උපකරණ සහ ගෘහභාණ්ඩ සහ සවිකිරීම් ඇතුළත් වත්කම් අයිතම 128 ක ඌනතාවයක් වාර්තා වී තිබුණි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 5.1 විගණන කමිටු

----------------

විගණන කමිටුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර පාරිශ්‍රම කමිටුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. කෙසේ වෙතත්, 2016 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් වෙනස්වීමට ලක්වීම හේතුකොට ගෙන සමාගම විසින් 2016 වර්ෂයේදී විගණන සහ පාරිශ්‍රම කමිටු සඳහා සාමාජිකයින් පත් කර නොතිබුණි.

## 6. පද්ධති සහ පාලන

**----------------------**

සමාගම විසින් නිකුත් කර ඇති කාර්යසාධනය බැඳුම්කර සඳහා කාර්යසාධන බැඳුම්කර සහ ප්‍රමාණවත් රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. එම නිසා අවදානම් හඳුනාගැනීමේ ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.